සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## ශෛවනෙරි I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශෛව ධර්මයේ 'ඕංගාරම්' මගින් සංකේතවත් කරන දෙවියා,
(1) විනායගර් ය. (2) සූර්යයා ය. (3) ශිව දෙවියන් ය. (4) මුරුගන් ය.

**2.** විවාහ මංගල උත්සවයක 'පාණික් කිරහනම්' යනු,
(1) මිරිස්ගලට පය තැබීම ය.
(2) මුද්ද ගැනීම ය.
(3) අත් ඇල්ලීම ය.
(4) 'අරුන්දති' තාරකාව පෙන්වීම ය.

**3.** 'වේදමෝඩු ආගමම් මෙයියාම් ඉරෛවන් නූල්...' යනුවෙන් සඳහන් වනුයේ,
(1) තිරුවිසෛප්පාහි ය. (2) තිරුප්පල්ලාණ්ඩුහි ය. (3) තිරුප්පුහල්හි ය. (4) තිරුමන්දිරම්හි ය.

**4.** කෙනෙකු මිය ගිය පසුව කරනු ලබන චාරිත්‍රය,
(1) අභරක් කිරියෛ වේ.
(2) පූර්වක් කිරියෛ වේ.
(3) නිත්‍ය කිරියෛ වේ.
(4) නෛමිත්තිය කිරියෛ වේ.

**5.** පංජකිරුත්තියම්වල සංහාර ක්‍රියාව පෙන්නුම් කරනු ලබන්නේ,
(1) කොඩියේට්‍රම්වලිනි. (2) තේරු උත්සවයෙනි. (3) වාහන උත්සවයයෙනි. (4) තීර්තම්වලිනි.

**6.** තිරිකරණම්වලටත් වඩා උසස් තත්ත්වයේ සිටින දෙවියන් හැඳින්වෙන නම කුමක් ද?
(1) පරම්පොරුල් (2) ශිවන් (3) උරුත්තිරන් (4) පරමසිවන්

**7.** කන්නගි අම්මන් සතුටු කරවීම සඳහා ගයනු ලබන ගීතිකාව කුමක් ද?
(1) කන්නගි අම්මන් පල්ලු පාඩල්
(2) සිලම්බු කුරල්
(3) තිරුක්කුලිර්ත්ති අම්මානෛ පාඩල්
(4) කන්නගි අම්මන් වලිනඩෛ සිංදු

**8.** වරලක්ෂ්මි උපවාසය කරනු ලබන්නේ,
(1) 'ආවණි' මාසයේ පොහොයට පෙර සිකුරාදා ය.
(2) 'මාර්ගලි' මාසයේ තිරුවාදිරෛ තාරකාව යෙදෙන දා ය.
(3) 'කාර්ත්තිගෛ' මාසයේ අවපස සෙනසුරාදා පිරදමෛ ය.
(4) 'ඓප්පසි' මාසයේ පුරපස පිරදමෛ ය.

**9.** අපගේ ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය වීමට වැඩිපුර ම ඉවහල් වන්නේ,
(1) උපවාස ය.
(2) නිත්‍ය කිරියෛ ය.
(3) එක්රැස් වී ප්‍රාර්ථනා කිරීම ය.
(4) උත්සව ය.

[දෙවැනි පිටුව බලන්න

**10.** ජීවිතයේ සතුට ලබා ගැනීම, දුක බෙදා හදා ගැනීම සහ එකිනෙකාට උදව් වන නෑදෑකම් ශක්තිමත් කිරීම යන ඒවාට උපකාරී වන්නේ,
(1) උබනයන චාරිත්‍රයයි. (2) අවමංගල්‍ය චාරිත්‍රයයි.
(3) වැඩිවියට පත්වීමේ චාරිත්‍රයයි. (4) විවාහ මංගල චාරිත්‍රයයි.

**11.** දීපාවලි උත්සවයේ දී **නො කළ** යුත්තේ,
(1) නව භාණ්ඩ මිලදී ගැනීම ය. (2) හිස තෙල් ගා දිය නෑම ය.
(3) මත්පැන් භාවිතය ය. (4) නිවසේ පිටි පහන් දැල්වීම ය.

**12.** පොන්නාලෙ වරදරාජ පෙරුමාල් දේවාලයේ දිය කැපීම සිදු කරනු ලබන ස්ථානය,
(1) කීරිමලෛ ය. (2) තිරුවඩිනිලෛ ය. (3) කාරෛනගර් ය. (4) මූලායි ය.

**13.** සියලු සෞභාග්‍යය ලබා ගැනීම සඳහා ගායනා කළ යුතු ගීතිකාව කුමක් ද?
(1) "පිත්තා පිරෛ සූඩි පෙරුමානේ..." (2) "කාදලාගික් කසින්දු කණ්ණීර් මල්ගි..."
(3) "නාමාර්ක්කුං කුඩියල්ලෝම්..." (4) "තනම්තරුම් කල්වි තරුම්..."

**14.** ශෛව ආගමික ජීවිතයේ දිනපතා අනිවාර්යයෙන් පැලඳිය යුත්තේ,
(1) කහ ය. (2) විභූති ය. (3) හඳුන් ය. (4) කුංකුමම් ය.

**15.** 'හෝම දුම අප ශරීරයේ වැදීම නිසා ශරීරයේ ඇතිවන රෝගාබාධ දුරු වේ' යන විශ්වාසයෙන් කරනු ලබන දේවාල චාරිත්‍රය වන්නේ,
(1) කාමියක් කිරියෛ ය. (2) නිත්‍ය කිරියෛ ය.
(3) කුම්බාභිෂේක කිරියෛ ය. (4) ආන්මාර්ත කිරියෛ ය.

**16.** ශිවාගමම් කීයක් වේ ද?
(1) දහහතරකි. (2) දහඅටකි. (3) විසිහතකි. (4) විසිඅටකි.

**17.** දොළොස්වැන්නේ යෙදෙන ශෛව තිරුමුරෛ,
(1) තිරුවිසෛප්පා ය. (2) තිරුප්පල්ලාණ්ඩු ය. (3) තිරුමන්දිරම් ය. (4) පෙරිය පුරාණම් ය.

**18.** 'පුවනේශ්වරී පීඩම්' යනුවෙන් ප්‍රශංසා කරනු ලබන අම්මන් දේවාලය,
(1) මඩකලපුවේ ශ්‍රී භද්‍රකාලි අම්මන් දේවාලය ය.
(2) නයිනතිවු නාගපූෂණි අම්මන් දේවාලය ය.
(3) වට්‍රාපලයි කන්නගි අම්මන් දේවාලය ය.
(4) ත්‍රිකුණාමලයේ දුර්ගෛ අම්මන් දේවාලය ය.

**19.** 'යෝගත්තිල් සරියෛ' යන්නෙහි අඩංගු වන්නේ,
(1) ඉයමම්, නියමම් සහ ආසනම් ය. (2) පිරත්තියාගාරම්, ප්‍රාණායාමම් සහ තියානම් ය.
(3) ඇසීම, සිතීම සහ අවබෝධ කර ගැනීම ය. (4) ඇසීම, තාරනෛ සහ සමාධි ය.

**20.** සරියෛ මාර්ගය පිළිපදින්නන් ලබන විමුක්තිය කුමක් ද?
(1) සාරූබම් (2) සාමීබම් (3) සාලෝගම් (4) සායුච්චියම්

**21.** සුන්දරර් තම දකුණු ඇසේ පෙනීම ලබාගත් දේවාලය වන්නේ,
(1) තිරුවෙන්පාක්කම් ය. (2) තිරුවාරූර් ය.
(3) තිරුවොට්‍රියූර් ය. (4) තිරුක්කච්චියේගම්බම් ය.

**22.** 'සාරධර්ම' යනුවෙන් හඳුන්වන්නේ මොනවා ද?
(1) විනය සහ කරුණාවන්තභාවයෙන් යුතු වීම ය.
(2) රාජකාරිය, සත්‍ය, පිරිසිදුභාවය යන ඒවා ය.
(3) විනයානුකූල ජීවිතය මගින් අනුගමනය කරනු ලබන සියලු ක්‍රියා ය.
(4) විනය සහ කළගුණ සැලකීමෙන් යුක්ත වීම ය.

**23.** ශෛව ධර්මයේ ආගමික හා සමාජීය දර්ශනය එකට පවතින බව පැහැදිලි කරන ප්‍රකාශය කුමක් ද?
(1) "පිං කිරීමට කැමති වන්න."
(2) "ඥානය යනු සත්‍යය වටහා ගැනීමයි."
(3) "හොඳ හා නරක යන ඒවා අනුන්ගෙන් ලැබෙන ඒවා නො වේ."
(4) "මහජන සේවය ශිව දෙවියන්ට කරන සේවයයි."

[තුන්වැනි පිටුව බලන්න

**24.** මඩකලපුව ප්‍රදේශයේ තුච්හදි අම්මන් දේවාල පිහිටි ස්ථාන ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) පාණ්ඩිරුප්පු, පලුගාමම්, ආරයම්පදි
(2) පුදූර්, පුලියන්තිවු, කල්මුණේ
(3) පුලියන්තිවු, පාණ්ඩිරුප්පු, කළුදාවලයි
(4) ආරයම්පදි, පලුගාමම්, කාරතිවු

**25.** සිත්තර්වරුන් දහඅටදෙනාගේ කණ්ඩායමට අයත් සිත්තර්වරුන්ගේ නම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) පට්ටිනත්තාර්, පත්තිරගිරියාර්, සෙල්ලප්පා සුවාමිහල්
(2) අගප්පේයි සිත්තර්, කුදම්බයි සිත්තර්, නවනාද සිත්තර්
(3) පාම්බාට්ටි සිත්තර්, කොංගණ සිත්තර්, සිත්තානයිකුට්ටි සිත්තර්
(4) තිරුමූලර්, අගත්තියර්, සිවවාක්කියර්

**26.** වේදවලට කියැවෙන වෙනත් නම් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) සුයම්බු, එලුදාමරෛ, සංහිදෛහල්
(2) එලුදාක්කිලවි, එලුදාමරෛ, සුරුදි
(3) එලුදාක්කිලවි, සුරුදි, ආරණියංගල්
(4) සුරුදි, සුයම්බු, ප්‍රාමණංගල්

**27.** දෙවියන් වාසය කරන ස්ථානය පමණක් නොව අපගේ සංස්කෘතිය වර්ධනය කරනු ලබන ස්ථානයක් ලෙස ද සලකනු ලබන්නේ,
(1) නිවාස ය.
(2) ආශ්‍රම ය.
(3) පාසල් ය.
(4) දේවාල ය.

**28.** 'තඩුත්තාට්කොණ්ඩ පුරාණම්' යන කොටස ඇතුළත් ග්‍රන්ථය,
(1) කන්ද පුරාණම් ය.
(2) පෙරිය පුරාණම් ය.
(3) කෝයිට් පුරාණම් ය.
(4) සේක්කිලාර් පුරාණම් ය.

**29.** මිනිසුන් දෙවියන් වීමට අත්‍යවශ්‍ය ඒවා ලෙස සැලකෙන්නේ,
(1) අධ්‍යාපනය සහ දැනුම ය.
(2) පිං කිරීම සහ කරුණාව ය.
(3) අවංකකම සහ සේවා ලැදිකම ය.
(4) කීර්තිය සහ ආඩම්බරය ය.

**30.** "පට්ට කට්ටයිට් පහල්කුරුඩු පෝගිරදු" යනුවෙන් සඳහන් කළේ,
(1) මරෛඥාන සම්බන්දර් ය.
(2) ගුරුඥාන සම්බන්දර් ය.
(3) තිරුඥාන සම්බන්දර් ය.
(4) අරුණන්දි සිවාචාරියාර් ය.

**31.** උඩරට රාජ්‍ය පැවති කාලයේ මුරුග වන්දනාව සඳහා නිර්මාණය කරන ලද පුදබිම කුමක් ද?
(1) ගඩලාදෙණිය විහාරය
(2) ඇම්බැක්ක දේවාලය
(3) ලංකාතිලක විහාරය
(4) නාථ දේවාලය

**32.** කොක්අඩිචෝලේ තාන්තෝන්ද්‍රිශ්වරම් දේවාලයේ පූජකතුමා හඳුන්වන්නේ කෙසේ ද?
(1) සංගමර්
(2) වණ්ණක්කර්
(3) වීර ශෛවර්
(4) සිවාචාරියාර්

**33.** පව්, පිං විස්තර ලේඛනගත කර, පව්වලට දඬුවම් දෙන ලෙස යමදර්මන්ට අණදෙනු ලබන්නේ,
(1) වෛරවර් විසිනි.
(2) සන්ඩෙශ්වරර් විසිනි.
(3) අය්යප්පන් විසිනි.
(4) සිත්තිරපුත්තිරනාර් විසිනි.

**34.** තීර්තම් වශයෙන් පාලාවිය යොදා ගෙන පිහිටා ඇති ශිව දේවාලය,
(1) නගුලේශ්වරම් ය.
(2) තාන්තෝන්ද්‍රිශ්වරම් ය.
(3) තිරුක්කේදීශ්වරම් ය.
(4) තිරුකෝණේශ්වරම් ය.

**35.** "කුනිත්ත පුරුවමුම් කොව්වෛ සෙව්වායිට් කුමින්සිරිප්පුම්..." යන ගීතිකාවේ සඳහන් වන ශිව මූර්තය වන්නේ,
(1) නඩරාජ මූර්තය වේ.
(2) සෝමාස්කන්ද මූර්තය වේ.
(3) ගංගාදර(ර්) මූර්තය වේ.
(4) දක්ෂණාමූර්ති මූර්තය වේ.

**36.** "නීරිල්ලා නෙට්ටි පාල්..."යනුවෙන් ගායනා කළේ,
(1) නක්කීරර් ය.
(2) ඖවෛයාර් ය.
(3) භාරතියාර් ය.
(4) සේන්දනාර් ය.

**37.** "රාවණන් මේලදු නීරු..." යන පද පේළිය සඳහන් වී ඇත්තේ පහත සඳහන් ඒවායින් කවරක ද?
(1) තේවාරම්හි ය.
(2) තිරුමුරුගාට්‍රපඩයි හි ය.
(3) කන්දපුරාණම් හි ය.
(4) තිරුප්පුහල් හි ය.

[හතරවැනි පිටුව බලන්න

● පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| පුරච්චන්දාන කුරවර් | ජීවන සිද්ධිය | ග්‍රන්ථය |
|---|---|---|
| A – අරුණන්දි සිවාචාරියාර් | D – ඥාන මාර්ගයේ කෙටි කලක් නිහඬව ජීවත් වූ කෙනෙකි. | G – තිරුවරුට්පයන් |
| B – මරෛඥාන සම්බන්දර් | E – ඇඳුරුතුමාගේ වැලමිටින් ගැලූ කැඳ ප්‍රසාදම් ලෙස සලකා පානය කළ අයෙකි. | H – සිවඥානසිත්තියාර් |
| C – උමාපති සිවාචාරියාර් | F – සියලු ආගමම් ග්‍රන්ථ පිළිබඳ විශාරදයෙකි. | I – සඳමණිත්තිරට්ටු |

**38.** පළමුවෙනි පරිච්ඡේද ලෙස 'පදිමූදූනිලයි' යන්න යෙදී ඇති ග්‍රන්ථය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AFH (2) BDI (3) CEG (4) CEH

**39.** "ආණවම්වල ස්වරූපය කුමක් ද?" යන්න ප්‍රශ්න කළ පුද්ගලයා හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) ADG (2) AFH (3) BFH (4) CDI

**40.** 'ආවණි' මාසයේ උත්තර නට්සත්තිරම්වල විමුක්තිය ලැබූ අය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AEH (2) AEG (3) BDI (4) CFH

* *

[පස්වැනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

## ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20**ක් ද, අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'වේදම්' යන වචනයේ තේරුම කුමක් ද?

(ii) ශෛව භක්තිකයින් ආහාර ගැනීමට පෙර ගැයිය යුතු ගීතිකාව කුමක් ද?

(iii) "රාජකාරිය ඉටු කරන්න, ප්‍රතිඵලය බලාපොරොත්තු නොවන්න" යනුවෙන් සඳහන් කරන ශුද්ධ වූ ග්‍රන්ථය කුමක් ද?

(iv) 'කන්නිගා තානම්' යනු මොනවා ද?

(v) සුන්දරමූර්ති නායනාර්තුමන්ගේ ගුරු පූජා දිනය කවදා ද?

(vi) 'සත්තසත්තෙත සාරා තසත්තරියා තංකණිවෙව
උයිත්තල්සද සත්තා මුයිර්'
මෙහි සඳහන් වන 'සදසත්තු' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?

(vii) නිවසක දිනපතා සිදුවන ආගමික කටයුතු **දෙකක්** ලියන්න.

(viii) 'අෂ්ටබන්දනම්' තුළ අඩංගු වන ද්‍රව්‍ය **දෙකක්** ලියන්න.

(ix) අරුණගිරිනාදර්තුමා විසින් මුරුග දෙවියන් උදෙසා රචනා කරන ලද භක්ති සාහිත්‍ය **දෙකක්** නම් කරන්න.

(x) ශෛව භක්තිකයකු තුළ පැවැතිය යුතු උසස් ගතිලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියම අනුපිළිවෙළට ලියන්න.

(ii) ඉහත (i) ට අදාළ ව ඔබ විසින් ලියන ලද ගීතිකාවල තේරුම ලියන්න.

(අ) "අංගමුම් වේදමුම් ඕදුනාවර්... "

(ආ) "තන්දදුන් තන්නෙක් කොණ්ඩදෙන්... "

(ඉ) "උම්බර්තරු තේනුමණික් කසිවාගි... "

(ඊ) "තනම්තරුම් කල්වි තරුම්..."

(උ) "තණ්ණලි වෙන්කුඩෙ වේන්දන් සෙයල්කණ්ඩු... "

**3.** "ශ්‍රී ලාංකේය ශෛව ආගමික ඉතිහාසයේ ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර්තුමාට සුවිශේෂ ස්ථානයක් හිමි වේ."

(i) ආරුමුග නාවලර්තුමා නල්ලූර්හි ස්ථාපිත කළ මුද්‍රණාලයේ නම කුමක් ද?

(ii) ආරුමුග නාවලර්තුමා විසින් රචනා කොට, ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ **තුනක්** සඳහන් කරන්න.

(iii) ආරුමුග නාවලර්තුමාගේ ශෛව ආගමික සේවා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** "ආධ්‍යාත්මික නිදහසට ඇති මාර්ගවලින් 'ශෛව නාට්පාදංගල්' ප්‍රමුඛත්වයක් ගනී."

(i) තායුමානවර්, ශෛව නාට්පාදංගල් සංසන්දනය කරන්නේ මොනවාට ද?

(ii) 'කිරියෛවල සරියෛ' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(iii) කිරියෛ මාර්ගය පිළිබඳව විස්තර කරන්න.

**5.** "එන් කඩන් පණි සෙයිදු කිඩප්පදේ..." - අප්පර් තේවාරම්

(i) තිරුනාවුක්කරසර්ගේ තේවාරම්වල 'පදිගම්' කීයක් තිබේ ද? ඒවා තිරුමුරෛ කීයකට බෙදා ඇත් ද?

(ii) ශිව දෙවියන් විසින් තිරුනාවුක්කරසර්ට තබන ලද මුද්‍රා **දෙක** මොනවා ද? එම අවස්ථාවේ ගයනු ලැබූ ගීතිකාව කුමක් ද?

(iii) තිරුනාවුක්කරසර් කළ හාස්කම් **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**6.** "කේඩුම් ආක්කමුම් කෝට්ට තිරුවිනාර්

ඕඩුම් සෙම්පොනුම් ඔක්කවේ නෝක්කුවාර්

කූඩුම් අන්බිනිල් කුම්බිඩලේ අන්ද්‍රි

වීඩුම් වේන්ඩා විරලින් විලංගිනාර්" - පෙරිය පුරාණම්

(i) පෙරිය පුරාණම් නම් ග්‍රන්ථය රචනා කළේ කවුද? එය කීවෙනි තිරුමුරෛවල අඩංගු වී ඇත් ද?

(ii) ශිව භක්තිකයන්ගේ සුවිශේෂතා මෙම ගීතිකාවෙන් විස්තර කර ඇත්තේ කෙසේ ද?

(iii) පෙරිය පුරාණම් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.

(i) පංචාංගම්

(ii) සුවාමි විපුලානන්දර්

(iii) විනායගර්ෂෂ්ටි උපවාසය

(iv) ශෛව දේවාල මගින් කෙරෙන සමාජ සේවා

* * *